(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 1(2).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2020 සැප්තැම්බර් 08 අඟහරුවාදා

## 2020 සැප්තැම්බර් 22 අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

114/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති එක් එක් ගම්මාන අතරින් —

(i) පානීය ජල ගැටලුව ඇති;

(ii) වගාවන්ට අවශ්‍ය ජලය නොමැතිව පීඩා විඳින;

ගම්මාන සංඛ්‍යාව හා ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් ගමේ ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

118/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මුල් අදියර සඳහා ජලය ලබාගැනීමට —

(i) ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) අදාළ කොන්ත්‍රාත්තුව මේ වනවිට ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) ගතවන කාලය කොපමණද;

(v) ඉදිකිරීම් මේ වනවිට ආරම්භ කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

124/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, යාපනය යන දිස්ත්‍රික්කවල ජීවත්වන ජනතාවගේ ප්‍රධාන රැකියාවලින් ධීවර වෘත්තිය එක් වෘත්තියක් බවත්;

(ii) එමගින් පවුල් දහස් සංඛ්‍යාවක් යැපෙන බවත්;

(iii) ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා නිසා මෙම ධීවරයන්ට දීර්ඝ කාලයක් තිස්සේ මසුන් ඇල්ලීමට මුහුදට යා නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත්;

(iv) ඉහත ප්‍රදේශවලින් මුහුදු යන ශ්‍රී ලාංකීය ධීවර යාත්‍රාවලට ඉන්දියානු යාත්‍රාවලින් විනාශයන් සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉන්දීය ට්‍රෝලර් යාත්‍රාවල නීතිවිරෝධී කටයුතු නතර කර අපගේ ධීවරයන්ට සුපුරුදු ලෙස ධීවර කටයුතුවල නියැලීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දකුණු ප්‍රදේශවලින් බොහෝ ධීවරයන් මුලතිව් දිස්ත්‍රික්කයට පැමිණ නැවතී සිට ධීවර කටයුතුවල නිරත වන බවත්;

(ii) ඒ හේතුවෙන්, මුලතිව් දිස්ත්‍රික්කයේ ධීවරයන්ට තම ධීවර කටයුතුවල නිරතවීමට බාධා සිදුවන බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) දකුණේ ධීවරයන් ඉහත ප්‍රදේශවල ධීවර කටයුතුවල නියැලීම නවතා දැමීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

156/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කඩුවෙල ප්‍රදේශයේ ඇතිවන ගංවතුර තර්ජනය අවම කිරීම සඳහා කැළණි ගංමිටියාවත ආශ්‍රිතව ව්‍යාපෘතියක් යෝජනා වී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය කවරේද;

(iii) එවැනි ව්‍යාපෘතියක් මේ වනවිට යෝජනා වී නොමැති නම්, එම ප්‍රදේශයේ ගංවතුර අවදානම අවම කිරීම පිණිස ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

180/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිළිනොච්චි නගරය මැද පිහිටා ඇති සීමාසහිත ලංකා සතොස වාණිජ ගොඩනැගිල්ල නිසි අනුමතියකින් තොරව ඉදිකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම අයත්වන ආයතනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම දීර්ඝකාලීනව බද්දට ලබා දී තිබේද;

(iii) එම ගොඩනැගිල්ලහි වර්තමාන අයිතිකරු කවරෙක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම ගොඩනැගිල්ල —

(i) ඉදිකිරීම සඳහා අනුමතිය, නිසි ක්‍රමවේදය අනුව කරෙච්චි ප්‍රාදේශීය සභාවෙන් ලබාගෙන තිබේද;

(ii) රජයේ වියදමින් ඉදිකරනු ලැබුවේ නම්, මිළගණන් කැඳවූ ආකාරය පිළිබඳ විස්තර කවරේද;

(iii) ඉදිකිරීමට දරන ලද පිරිවැය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

204/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා රෝගීන් දහස් ගණනක් වසර ගණනාවක් තිස්සේ රජයේ රෝහල්වල පොරොත්තු ලේඛනයේ සිටින බවත්;

(ii) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පෞද්ගලික රෝහල්වලින් එම සැත්කම් සිදු කර ගැනීම සඳහා රුපියල් මිලියන ගණනක් දැරීමට සිදු වන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) පසු ගිය වසර පහක කාලය තුළදී ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ හෘද ආශ්‍රිත රෝග සංඛ්‍යාව කොපමණද;

(ii) හෘදය සැත්කම් සිදු කර ගැනීම සඳහා පසු ගිය වසර පහක කාලය තුළදී රජයේ රෝහල්වල ලියාපදිංචි වී ඇති රෝගීන් සංඛ්‍යාව කොපමණද; සහ

(iii) එසේ ලියාපදිංචි වූ රෝගීන් සඳහා පසු ගිය වසර පහ තුළදී වාර්ෂිකව සිදු කරන ලද සැත්කම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) (i) වර්තමානයේදී අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය පිළිබඳව රජය සෑහීමකට පත්වන්නේද; සහ

(ii) දැනට පවත්නා මෙම තත්ත්වය වැඩිදියුණු කර ගැනීම පිණිස ඒ සම්බන්ධයෙන් සිදු කර ඇති ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

208/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ මාළු ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම මාළු ආනයනය කළ රටවල්;

(iv) එම මාළු ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට මාළු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

247/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති හන්තාන වත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ''උදාගම්මාන නිවාස වැඩසටහන'' ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එකී වැඩසටහන යටතේ ඉහත වත්තේ ආරම්භ කර ඇති —

(i) එක් එක් උදාගම්මාන නිවාස වැඩසටහන් සංඛ්‍යාව;

(ii) වැඩසටහනට ඇතුළත් නිවාස සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එක් නිවසක් ඉදිකිරීම සඳහා එක් එක් නිවාසලාභියාට —

(i) ලබා දෙන බවට එකඟ වූ මුළු මුදල;

(ii) ලබා දෙන මුළු මුදලින් ණය මුදල;

(iii) ලබා දෙන මුළු මුදලින් ආධාර මුදල;

(iv) මෙතෙක් ලබාදී ඇති මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එක් එක් නිවාසලාභියාට අදාළ ඉතිරි මුදල ලබාදී, මෙම ව්‍යාපෘතිය නිමකිරීමට පියවර ගන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 සැප්තැම්බර් 23 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

115/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කර්මාන්තපුර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් කර්මාන්තපුරයේ පිහිටි කර්මාන්තශාලා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් කර්මාන්තපුරය තුළ රැකියාවල නිරතව සිටින මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි කර්මාන්තපුර තවදුරටත් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

119/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී හානියට පත්වන දේපළ හා ඒ වෙනුවෙන් අත්කර ගනු ලබන ඉඩම්වලට වන්දි ගෙවීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එම වන්දිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා තක්සේරුකර ඇති වන්දි ප්‍රමාණය කොපමණද;

(iv) මේ සම්බන්ධව ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත මේ වනවිට ප්‍රතිපාදන නිදහස් කර තිබේද;

(v) එසේ නම්, එම මුදල කොපමණද;

(vi) එම ප්‍රතිපාදන නිදහස් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

125/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා ස්ථානයක් තෝරාගෙන සැලසුම් සකස් කර ඇති බවත්;

(ii) එහෙත්, මේ දක්වා එහි වැඩකටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත ක්‍රීඩාංගණයේ වැඩකටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්නාරම දිස්ත්‍රික් ක්‍රීඩාංගණය ඉදිකිරීමේ කටයුතු සියයට පනහකට වඩා අවසන් කොට ඇතත්, දැනට අවුරුදු 2 කාලයක් පුරා එහි වැඩ නැවතී ඇති බවත්;

(ii) මන්නාරම නගර සීමාවට අයත් එමිල් නගර් ප්‍රදේශයේ ඉදිවෙමින් පවතින මහජන ක්‍රීඩාංගණයේ පළමුවන කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කොට ඇතත්, එහි දෙවන කොටසේ ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) එසේනම්, ඉහත ක්‍රීඩාගණයේ දෙවැනි කොටසේ වැඩකටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

157/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ඇතැම් ප්‍රදේශ පැය කිහිපයක වර්ෂාපතනයකින් පවා වැසි ජලයෙන් යටවන බවත්;

(ii) මේ හේතුවෙන් මාර්ගවල වතුර පිරී, ජන ජීවිතය අඩාළ වන බවත්;

(iii) වැසි ජලය බැසයාමේ නිසි ක්‍රමවේදයක් නොමැති වීම මෙම තත්ත්වයට ප්‍රධානම හේතුව බවත්;

(iv) මෙයට පිළියම් ලෙස ප්‍රධාන බෝක්කු 25ක් සංවර්ධනය කිරීමට පසුගිය රජයේ අනුමතිය ලබා දෙන ලද අතර ඉන් පහක වැඩ පසුගිය රජයේ පාලන කාලය තුළදී නිම කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත බෝක්කු 25 අතරින් මෙතෙක් සංවර්ධනය කිරීමට නොහැකි වූ බෝක්කු සංවර්ධනය කිරීම සඳහා මෙම රජයේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

342/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018/05/11 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමක් අනුව විගණන පරීක්ෂක සේවයේ II ශ්‍රේණියට විගණන පරීක්ෂකවරුන් බඳවා ගැනීම - 2018 සඳහා විවෘත තරග විභාගයක් පැවැත්වූ බවත්;

(ii) එම තරග විභාගය 2018 ඔක්තෝම්බර් 14, 20 සහ 21 යන දිනයන්හි විභාග මධ්‍යස්ථාන කිහිපයකදී පැවැත්වූ බවත්;

(iii) එකී තරග විභාගයේ ප්‍රතිඵල මේ වනතෙක් නිකුත් කර නොමැති බවත්;

(iv) එකී තරග විභාගය පවත්වා මේ වනවිට අවුරුදු 2ට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විභාගයේ ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු සුදුසුකම් ලැබූ අපේක්ෂකයන්ට අදාළ පත්වීම් කඩිනමින් ප්‍රදානය කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

205/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තමන්ට මුහුණ දීමට සිදු වී ඇති මරණ තර්ජන සම්බන්ධයෙන් 2020.04.09 දින උදෑසන ඊමේල් මගින් පොලිස්පතිවරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ, මහනුවර, කටුගස්තොට ප්‍රදේශයේ පදිංචි රම්සි රාසික් මහතාව එදින ම සවස අත්අඩංගුවට ගැනීමේ නියෝගයක් නොමැතිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගන්නා ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රම්සි රාසික් මහතාව අත්අඩංගුවට ගෙන, 2020 අප්‍රේල් 09 දින සිට මේ දක්වා ම රිමාන්ඩ් බාරයේ රඳවා ගෙන සිටින්නේ මන්ද;

(ii) ඒ මහතාව අත්අඩංගුවට ගෙන ඇත්තේ කෙසේද;

(iii) ඔහුට විරුද්ධව යම් පැමිණිල්ලක් තිබුණේද;

(iv) එසේ නම්, එම පැමිණිල්ල සිදු කර ඇත්තේ කවුරුන්ද;

(v) ඒ මහතා කිසියම් වරදක් සිදු කර තිබේද;

(vi) එසේ නම්, එම වැරදි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ දී ඒ හා සමාන ආකාරයේ වැරදි සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයන් කිසිවෙකු අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) සියලුම පුද්ගලයන්ට එක හා සමාන ආකාරයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය සෑහීමකට පත්වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දැනුම් දෙන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

209/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කඩදාසි ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම කඩදාසි ආනයනය කළ රටවල්;

(iv) එම කඩදාසි ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කඩදාසි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

248/ 2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් ලෙවලන්ඩ් වත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් “උදා ගම්මාන නිවාස වැඩසටහන” ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එකී වැඩසටහන යටතේ ඉහත වත්තේ ආරම්භ කර ඇති —

(i) එක් එක් උදාගම්මාන නිවාස වැඩසටහන් සංඛ්‍යාව;

(ii) වැඩසටහනට ඇතුළත් නිවාස සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එක් නිවසක් ඉදිකිරීම සඳහා එක් එක් නිවාසලාභියාට —

(i) ලබා දෙන බවට එකඟවූ මුළු මුදල;

(ii) ලබාදෙන මුළු මුදලින් ණය මුදල;

(iii) ලබාදෙන මුළු මුදලින් ආධාර මුදල;

(iv) මෙතෙක් ලබාදී ඇති මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එක් එක් නිවාසලාභියාට අදාළ ඉතිරි මුදල ලබාදී, මෙම ව්‍යාපෘතිය නිමකිරීමට පියවර ගන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

54/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ, මහාමාර්ග අමාත්‍යාංශයට, ඌව පළාත් සභාවට හා අදාළ පළාත් පාලන ආයතනවලට අයත් මාර්ගවල දුර කිලෝමීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාර්ග අතරින් දැනට අබලන් වී ඇති මාර්ගවල නම් කවරේද;

(iii) දැනට අබලන් වී ඇති මාර්ගවල දුර ප්‍රමාණය කිලෝමීටර්වලින් කොපමණද;

(iv) එසේ අබලන්වී ඇති මාර්ග කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

97/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව, ඉන්දියාවේ අධිවේගී මාර්ග ජාලයට සම්බන්ධ කිරීමේ සැලසුමක් රජය විසින් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක වන දිනය කවරේද;

(iii) ඒ සඳහා ශ්‍රී ලංකා රජය වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවට ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය නිසා සිදු විය හැකි අහිසි සංස්කෘතික හා සමාජීය පරිවර්තනයන් පිළිබඳ විද්වත් අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම අධ්‍යයනයේ නිර්දේශ කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 සැප්තැම්බර් 24 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

116/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝ සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඩිපෝවල නම් කවරේද;

(iii) එම එක් එක් ඩිපෝවේ දැනට ධාවනයට සුදුසු තත්ත්වයේ පවතින බස්රථ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් ඩිපෝව තුළ ඇති සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝවල බස් රථ ඇණි හා මානව සම්පත වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

120/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව ලබා දී ඇති ආයතනය කවරේද;

(ii) ඉහත ආයතනයට එම කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති ක්‍රමවේදය කවරේද;

(iii) ඒ සඳහා කොන්ත්‍රාත් මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ලබාදී ඇති කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

126/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිවු දිස්ත්‍රික්කයේ, පුදුකුඩිඉරුප්පු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රධාන වැව් අතරින් එකක් වන නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය රජය විසින් අනුමතිය ලබාදී, එයට මිලියන 40ක මුදල් ප්‍රතිපාදන ද වෙන්කරන ලද නමුත්, අඛණ්ඩව ඇද වැටුණු වර්ෂාව හේතුවෙන් මෙම ප්‍රතිසංස්කරණ වැඩකටයුතු සිදුනොකර ප්‍රතිපාදන ආපසු යවා ඇති බවත්;

(ii) මෙම වැව යටතේ බොහෝ කුඹුරු හා ගොඩඉඩම් තිබෙන අතර ග්‍රාමීය ජනතාව තම ජීවනෝපාය සඳහා මෙම වැව කෙරේ විශ්වාසය තබාගෙන ඇති බවත්;

(iii) නංජුන්ඩාන්කුලම් වැව බැම්මේ තිබෙන අනවශ්‍ය ගස් කපා ඉවත් කිරීම සඳහා දැව සංස්ථාවට අනුමතිය ලබා දී ඇතත්, ප්‍රවාහනය සඳහා මාර්ගය අබලන් වී ඇති බැවින් මෙතෙක් එය ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම නංජුන්ඩාන්කුලම් වැව ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩකටයුතු සඳහා මුදල් වෙන්කරන දිනය කවරේද;

(ii) ප්‍රවාහනය සඳහා මාර්ගය පිළිසකර කර, ඉහත වැව ප්‍රතිසංස්කරණයට අදාළ වැඩ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

158/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට බලපාන ගංවතුර අවදානම අවම කිරීම සඳහා පොම්පාගාර පහක් ඉදි කිරීමේ කටයුතු පසුගිය කාලයේදී ආරම්භ කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පොම්පාගාර පහ ඉදිකිරීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) එලෙස වෙන් කරන ලද මුදලින් සිදු කරනු ලැබූ වැඩ ප්‍රමාණය එක් එක් පොම්පාගාරය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත පොම්පාගාර පහෙන් මේ වනවිට මුළුමනින්ම වැඩ අවසන් කර ඇති පොම්පාගාර සංඛ්‍යාව කවරේද;

(iv) වැඩ අවසන් නොවූ එක් එක් පොම්පාගාරවල වැඩ අවසන් කිරීමට නියමිත දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

343/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකාව තුළ අස්වද්දන ලද මුළු කුඹුරු ප්‍රමාණය;

(ii) ඒ අතරින් වගාවට යොදා ගෙන ඇති කුඹුරු ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ඇති පුරන් කුඹුරු ප්‍රමාණය කොපමණද;

(ii) ඒවා වගාවන් සඳහා යොමු කිරිමට සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

(iii) ඒ සඳහා අවශ්‍ය කරන බීජ හා පොහොර නිසි පරිදි සැපයීමට ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වගාවට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර, සහන මිල ක්‍රමයකට ලබාදීමට සැලසුම්කර තිබේද;

(ii) කෘෂිකර්මාන්තය සඳහා තරුණ පරපුර යොමු නොවීම නිසා ඇති වී ඇති ශ්‍රම බලකාය අඩුවීම යථාවත් කිරීමට ආකර්ෂණීය සැලැස්මක් ක්‍රියාත්මක වන්නේද;

යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

210/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සීනි ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම සීනි ආනයනය කළ රටවල්;

(iv) එම සීනි ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සීනි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

249/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පිහිටා ඇති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් කැලැබොක්ක වත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ''උදා ගම්මාන නිවාස වැඩසටහන'' ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එකී වැඩසටහන යටතේ ඉහත වත්තේ ආරම්භ කර ඇති —

(i) එක් එක් උදාගම්මාන නිවාස වැඩසටහන් සංඛ්‍යාව;

(ii) වැඩසටහනට ඇතුළත් නිවාස සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එක් නිවසක් ඉදිකිරීම සඳහා එක් එක් නිවාසලාභියාට —

(i) ලබාදෙන බවට එකඟවූ මුළු මුදල;

(ii) ලබාදෙන මුළු මුදලින් ණය මුදල;

(iii) ලබා දෙන මුළු මුදලින් ආධාර මුදල;

(iv) මෙතෙක් ලබා දී ඇති මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එක් එක් නිවාසලාභියාට අදාළ ඉතිරි මුදල ලබාදී මෙම ව්‍යාපෘතිය නිමකිරීමට පියවර ගන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

55/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ජලසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ගම්මාන අතරින් පානීය ජල දුෂ්කරතා ඇති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල පානීය ජල ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්,ඒ මන්ද?

98/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෝලීය දේශගුණ විපර්යාසයන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ දේශගුණයට අයහපත් බලපෑම් සිදුවන බවත්;

(ii) එය ශ්‍රී ලංකාවේ ආර්ථික, සාමාජීය, සංස්කෘතික හා වෙනත් අංශයන්ට සෘජුව බලපාන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ගෝලීය දේශගුණ ප්‍රවනතාවන් ශ්‍රී ලංකාවට බලපාන ආකාරය පිළිබඳ විද්වත් අධ්‍යයනයක් සිදු කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අධ්‍යයනයේ නිර්දේශ කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් සිදු කිරීමට විද්වත් කමිටුවක් පත් කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

122/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනයේදී ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් ඉවත් කිරීමේදී ඒවා ලබා දෙන ලද පාර්ශ්වයන් කවරේද;

(iii) ඒ සඳහා භාවිතා කළ ක්‍රමවේදය කවරේද;

(iv) එක් පොල් ගසකට ලබා දුන් මිල කොපමණද;

(v) එමගින් උපයා ගත් මුදල්, භාරයේ පවතින ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 සැප්තැම්බර් 25 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

117/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සේවය කළ/කරන එක් එක් නිලධාරියාගේ ලිපිනය සහ නිලධාරියාට මාසිකව ගෙවන ලද වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ඔවුන් ලැබූ වැටුප් හා වෙනත් වරප්‍රසාදවලට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීමට ඔවුන්ගේ පාලන කාලය තුළ සමත් වී නැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තවදුරටත් වැඩි දියුණු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

121/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මේ දක්වා ගිවිසුම්ගතව ඇති ආයෝජන සංඛ්‍යාව;

(ii) එම ආයෝජනවල වටිනාකම;

(iii) එම ආයෝජනවලින් දැනට වැඩ ආරම්භකර ඇති සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

127/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පැවති යුද්මය වාතාවරණය අවසන් වී වසර දහයක් ගත වුවද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිලිනොච්චි - මුලතිව් A50 ප්‍රධාන මාර්ගයේ ඇති ප්‍රධාන පාලම වන මීටර 402ක් දිග වට්ටුවාකල් පාලම මෙතෙක් කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොකොට එක් වාහනයක් පමණක් ගමන් කළ හැකි පරිදි අබලන් වූ කුඩා පාරක් ලෙස තිබෙන හෙයින් ගමනාගමනයට බාධාවන් ඇති බවත්;

(ii) පසුගිය පාලන සමයේ දී මේ පිළිබඳව මවිසින් බොහෝ අවස්ථාවල මෙම සභාවේ සඳහන් කළ නමුත්, ඒ පිළිබඳව මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ඉහත වට්ටුවාකල් පාලම ද්විත්ව තීරු මාර්ගයක් ලෙස ප්‍රතිසංස්කරණය කොට ජනතාවට සාමාන්‍ය පරිදි ගමනාගමනය සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

159/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේදී මීතොටමුල්ල කසළ කන්ද නාය යෑම හේතුවෙන් ජීවිත, නිවාස මෙන්ම රථවාහන ද හානියට පත් වූ බවත්;

(ii) එහිදී අහිමි වූ ජීවිත සහ නිවාස සඳහා වන්දි මුදල් ලබා දීමට හැකි වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මීතොටමුල්ල කසළ කන්ද නාය යෑම හේතුවෙන් හානි වූ රථවාහන සඳහා —

(i) වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) වන්දි ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

(iii) වන්දි ඉල්ලා ලැබී ඇති අයදුම්පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි ලබා දීමට රජයේ තක්සේරුවක් සිදු කරනු ලැබුවේද;

(v) එසේ නම්, එකී තක්සේරුවට අනුව වන්දි ලබා දුන් රථවාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වන්දි ලබා නොදුන් රථවාහන සඳහා වන්දි ලබා දෙන දිනය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

344/2020

ගරු මයන්ත දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තේ ශක්ති අරමුදලේ ආරම්භයේ සිට මේ දක්වා ඇති මුදල කොපමණද;

(ii) මෙම අරමුදලෙන් කුඩා තේ වතු හිමියන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ කවරේද;

(iii) තේ ශක්ති අරමුදලේ ආරම්භයේ සිට මේ දක්වා එහි සමාජිකත්වය ලබා ඇති සංඛ්‍යාව කවරේද;

(iv) මෙම අරමුදලට කුඩා තේ වතු හිමියන් විසින් ආයෝජනය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තේ ශක්ති අරමුදල්වලින් තේ කර්මාන්තශාලා ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම කර්මාන්තශාලා සංඛ්‍යාව කවරේද;

(iii) එම කර්මාන්තශාලා ආරම්භ කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) ඒ සඳහා වැයකර තිබෙන මුළු මුදල කොපමණද?

(v) කර්මාන්තශාලා සඳහා ආයෝජනය කළ මුදල්වලින් කිසියම් ලාභයක් ලබන්නේද;

(vi) එසේ නම්, එම ලාභය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

211/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ඇළුමිනියම් ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම ඇළුමිනියම් ආනයනය කළ රටවල්;

(iv) එම ඇළුමිනියම් ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ඇළුමිනියම් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

250/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ, තෙල්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් වෛතලාව වත්තේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ''උදා ගම්මාන නිවාස වැඩසටහන'' ආරම්භ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එකී වැඩසටහන යටතේ ඉහත වත්තේ ආරම්භ කර ඇති —

(i) එක් එක් උදාගම්මාන නිවාස වැඩසටහන් සංඛ්‍යාව;

(ii) වැඩසටහනට ඇතුළත් නිවාස සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එක් නිවසක් ඉදිකිරීම සඳහා එක් එක් නිවාසලාභියාට —

(i) ලබාදෙන බවට එකඟවූ මුළු මුදල;

(ii) ලබා දෙන මුළු මුදලින් ණය මුදල;

(iii) ලබා දෙන මුළු මුදලින් ආධාර මුදල;

(iv) මෙතෙක් ලබාදී ඇති මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එක් එක් නිවාසලාභියාට අදාළ ඉතිරි මුදල ලබාදී මෙම ව්‍යාපෘතිය නිමකිරීමට පියවර ගන්නේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

57/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල ශික්ෂණ රෝහලේ සේවය කළ වෛද්‍ය සාෆි නමැති වෛද්‍යවරයා සිංහල ජාතික කාන්තාවන්ට වඳ සැත්කම් කළ බවට චෝදනා නැගුණු බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍යවරයාට එරෙහිව අධිකරණයේ පැවති නඩුවේදී ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම වෛද්‍යවරයාට එරෙහිව මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම වෛද්‍යවරයාට එරෙහිව පවත්වන පරීක්ෂණ කඩිනම් කොට අගතියට පත් මව්වරුන්ට සාධාරණය ඉටු කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

99/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ විල්පත්තු ජාතික වනෝද්‍යානය ප්‍රමුඛ වනාන්තර වැස්ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් විනාශ වන බවත්;

(ii) මේ වනවිටත් උතුරු මැද පළාත අර්ධ කාන්තාර තත්ත්වයට පත්වී ඇති බවත්;

(iii) මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ සමස්ත දේශගුණයට බලපා ඇති බවත්;

(iv) එහෙයින් නිරන්තරයෙන් ශ්‍රී ලංකාවේ කුමන හෝ පළාතක් ගංවතුර, නියගය, නාය යෑම් ආදී ස්වභාවික ව්‍යවසනවලින් පීඩා විඳින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පරිසරය සුරැකීමේ ජාතික ප්‍රතිපත්තින් සකස් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ශ්‍රී ලංකාවේ දේශගුණ විපර්යාස පිළිබඳ විද්වත් කමිටුවක් හරහා අධ්‍යයනයක් සිදු කිරීම සුදුසු යැයි එතුමා පිළිගන්නෙහිද?

(ඉ) එසේ නම්, එම අධ්‍යයනය සිදු කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

123/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිංගිරිය අපනයන සැකසුම් කලාපය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පවරා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් පවරා ගැනීම සිදු කරන ලද ආයතන කවරේද;

(iii) එම ඉඩම් පවරා ගත් දිනය කවරේද;

(iv) එම ඉඩම් සඳහා ගෙවන ලද වටිනාකම කොපමණද;

(v) එම ඉඩම්වල වටිනාකම තක්සේරු කරන ලද ක්‍රමවේදය කවරේද;

(vi) දැනට එම ඉඩම්වල ඇති පොල් වගාවන්වල නඩත්තුව හා එම ඵලදාවන් ලබාගැනීම සිදු කරන ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

303/2020

ගරු හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන සඳහා වූ රාජ්‍ය අමාත්‍යාංශයක් පිහිටුවා ඇති පසුබිමක —

(i) ශ්‍රී ලංකාව තුළ බහු විවෘත විශ්වවිද්‍යාල ආරම්භ කිරීමට රජය අරමුණු කර තිබේද;

(ii) රජය විසින් දුරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීමට අදහස් කරන්නේ, උසස් අධ්‍යාපනය ලැබීමට බලාපොරොත්තු වන කවර කණ්ඩායම් ඉලක්ක කරගෙනද;

(iii) දුරස්ථ අධ්‍යාපන අවස්ථා සඳහා සහනාධාර ලබා දීමට ඉදිරියේදීත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එහි අරමුදල් යටතේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය තවදුරටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එය පාලනයට නතු කරනු ලබන අධිකාරිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?;

(ඇ) (i) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කටයුතු සඳහා වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) විශ්ව විද්‍යාලය සඳහා දරනු ලබන වියදමින් රජය විසින් දරනු ලබන ප්‍රමාණය කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?